## 18 – කුරුළු රංචු

කුරුළු රංචු උදෙන් පිබිද ගීත ගයනවා
සුවඳ පියුම් මානෙල් මල් දැන් පිබිදෙනවා
සොබා දහම වතට වතදී සිනා පානවා
සැවොමැ එක්වැ මැව්ව දෙවිඳු මහිමේ කියනවා

එන්න සැමදෙනා එක්වා අදරිනා
මෙ පුදසුන වටා ආදරින්  මෙ දා
ගයා දණනමා වඳමු දෙවි තුමා

අළුත ගෙතුනු අරුත් පිරුනු වදන් සොයාලා
පසස දෙමින් මිහිරි සරින් තාල ගොතාලා
සැවොම එකවැ දෙවිඳුන් හොඳ ගයමු තුටුවෙලා
දෙවිඳු පුතුට තුරුළු වෙමින් සැනසිලි ලබලා

නටමු ගයමු සොඳුරු ලොවක සාදයෙන් පිනා
වියොල වයා සතුට බෙදා දසට සැම දිනා
සමිඳු සමග එක්වැ සිටින දුබල ලෙව් දනා
මිතුරු දහම වඩවි මොලොව ගයා සතුටිනා